# බුදු දහම පිළිබඳ දෙ වැනි ජුවාම් පාවුලු පාප්තුමන්ගේ ප්‍රකාශය සධාර්මික ද? අන්තරාගමික සංවාදයට එහි බලපෑම කුමක් ද?

වයි. ටී. පී. විජේසේකර[1]

1994 අග භාගයේත් 1995 මුල් භාගයෙත් බෙහෙවින් සාකච්ඡාවට බඳුන් වූ දෙ වැනි ජුවාම් පාවුලු පාප්තුමාගේ ‘Crossing the Threshold of Hope’ හෙවත් ‘බලාපොරොත්තුවේ එළිපත්ත’ නම් ග්‍රන්ථයේ බුදු දහම අශුභවාදී ධර්මයක් ලෙස අර්ථ ගන්වා තිබූ ‘Buddha’ නම් වූ ප්‍රකාශය වෙත අවධානය යොමු කිරීම මේ අධ්‍යයනයේ අන්තර්ගතය වේ. දෙ වැනි ජුවාම් පාවුලු පාප්තුමන්ගේ මේ ප්‍රකාශය බෞද්ධ ධර්මයට අනුව කෙතෙක් දුරට සධාර්මික වන්නේ ද යන්න විමසා බැලීම මේ පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වේ. තව ද බහු ආගමික සංස්කෘතියකට හිමිකම් කියන රටක් වශයෙන් ලාංකේය සමාජයේ පැවතිය යුතු ආගමික සහජීවනයට මේ ප්‍රකාශයෙන් ඇති කළ අර්බුදය පාප්තුමන්ගේ නො වරදිනසුලුබව යන ධර්ම සිද්ධාන්තය පදනම් කරගෙන විමසීම මේ පර්යේෂණයේ තවත් අරමුණකි. මෙහි දී බෞද්ධ හා කිතුනු විද්වත් මත කීපයක් ඇසුරින් මේ පර්යේෂණ මාතෘකාව විමර්ෂණයට බඳුන් කෙරේ.

**ප්‍රමුඛ පදඃ** පාප්තුමා, බුදු දහම, කිතුනු දහම, සධාර්මික භාවය, බහු ආගමික සංස්කෘතිය

[1] බටහිර සම්භාව්‍ය හා ක්‍රිස්තියානි සංස්කෘති අධ්‍යයන අංශය